# ගැටුම්වලින් තොර යහපත් සමාජයක් බිහිකර ගැනීම උදෙසා සිගාලෝවාද සූත්‍රයෙන් ලද දායකත්වය

එච්. එම්. එස්. කේ. හේරත්[1]

## හැඳින්වීම

ජනතාවගේත් සමාජයේත් අභිවෘද්ධිය උදෙසා වැදගත් කරුණු රැසක් බෞද්ධ ඉගැන්වීම්වල අන්තර්ගතකර තිබේ. සෑම බෞද්ධයෙකුගේම මූලික අභිප්‍රාය වන්නේ නිවන පසක්කර ගැනීමයි. ඒ සඳහා ලෞකික ජීවිතය සාර්ථකව ගතකළ යුතු වේ. එවිට මෙලොවජීවිතයේ දියුණුව පදනම්කර ගනිමින් පරලොව ජීවිතය දියුණුකර ගැනීම උදෙසා ජනතාව ධාර්මිකව හැසිරිය යුතු ය. මිනිසා දමාජ සත්ත්වායකු වන අතර ඔහු හා සමාජය අතර ඓන්ද්‍රිය බැඳීමක් පවති. ඒනිසා පුද්ගල අභිවෘද්ධිය මත සමාජ අභිවෘද්ධිය රදාපවතියි. පුද්ගල හැඩගැසීම යහපත් සමාජයක් ගොඩනගා ගැනීම උදෙසා ඉවහල් වේ. සමාජයේ තුළ පීවත්වන සෑම පුද්ගලයෙකුම සදාචාරාත්මක ගුණ ධර්මයන්ට අනුව තම පීවිත සකස්කර ගැනීම වැදගත් වේ. එනමුත් වර්තමාන සමාජ පසුබිම තුළ මෙම තත්ත්වය බිඳ වැටෙමින් පවති. ඒනිසා සමාජයේ නිරතුරුව ගැටුම් ඇති වේ. සමාජයේ පීවත්වන සෑම පුද්ගලයෙකුම එකිනෙකා වෙත ඉටුවිය යුතු යුතුකම්, ඉටුකරන්නේ නම් මෙවැනි ගැටුම් සමාජය තුළ ඇති නොවේ.තමාගෙන් ඉටුවිය යුතු යුතුකම් වගකීම් ඉටු නොකර තමාට හිමිවිය යුතු අයිතිවාසිකම් ලබා ගැනීමට අරගල කිරීමත් සමග වර්තමාන සමාජ පසුබිම තුළ විවිධ ගැටුම්, ප්‍රශ්න උද්ගත වී ඇත.අයිතිවාසිකම් දිනාගැනීමට නම් ඔවුනගෙන් ඉටුවිය යුතු යුතුකම් වගකීම් නිසියාකාරයෙන් ඉටු කිරීම වැදගත් වේ.

## ක්‍රමවේදය

බුදුරජාණන් වහන්සේ විසින් සමාජ සම්බන්ධතාවන්ගේ ධාර්මික සැකැස්ම උදෙසා ඉවහල්වන කරුණු රාශියක් ඉදිරිපත් කර තිබේ. ඒ අතර පුද්ගලයාගේ පිරිහීමට හේතුවන කරුණු පරාභව සූත්‍රයේ හා වසල සූත්‍රයෙහි සඳහන්කර ඇත. ගැටුම් හා ප්‍රශ්නවලින් තොර සාමකාමී සමාජයක් බිහිකරලීම උදෙසා බුදුන්රදුන් විසින් සිඟලෝවාද සූත්‍රය දේශනාකර තිබේ. එහි යුතුකම් වගකීම් නිසායාකාරයෙන් ඉටුකරනු ලබන විට හිමිවිය යුතු අයිතීන් නිතැත්තෙන්ම හිමිවන බව දක්වා තිබේ. මෙම සූත්‍රය වර්තමාන සමාජයේ උද්ගතවී තිබෙන බොහෝ ගැටුම් නිරාකරණයකර ගැනීම උදෙසා ඉවහල් වන්නකි. එහි පුද්ගලයන් විසින් උපයා ගන්නා ලද ධනය ආරක්ෂාකර ගත යුතු ආකාරය හා ධනය ක්‍රමානුකූලව පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳව දක්වා තිබේ. උපයාගත් ධනය ක්‍රමානුකූලව පරිහරණය නොකළහොත්

---

[1] උපාධි අපේක්ෂක, පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, hmsumuduherath@gmail.com

ධනය විනාශවන බවත් ඉන් පුද්ගලයා පිරිහෙන බවත් දක්වා තිබේ. පුද්ගලයා පිරිහෙන විට සමාජය ද පිරිහෙයි. ධනය විනාශ වී යාමත් සමග වැරදි මාර්ගයෙන් මුදල් උපයා ගැනීම උදෙසා පුද්ගලයින් යොමු වී සිටී. වර්තමාන සමාජය තුළ සම්බන්ධතා බිඳවැටීමත් සමග විවිධ ප්‍රශ්න ඇති වි තිබේ. මෙම තත්ත්වය අධ්‍යයනය කිරීම සඳහා නිරීක්ෂණය හා මූලාශ්‍ර අධ්‍යයනයක් සිදු කරන ලදි. වර්තමාන සමාජයේ බොහෝ සම්බන්ධතාවයන් දෙදරා ගොස් තිබේ. සමාජ සංස්ථා අතර පවතින සම්බන්ධතාවය ශක්තිමත්කර ගැනීම උදෙසා එකිනෙකා විසින් යුතුකම් වගකීම් නිසායාකාරයෙන් ඉටු කිරීම වැදගත් වේ. යුතුකම් වගකීම් මගහැරීමත් සමග සම්බන්ධතා බිඳ වැටෙයි. එවිට සමාජ ගැටලු පැනනගී. වර්තමාන සමාජ පසුබිම තුළ මෙම තත්ත්වය සුලබ සිදුවීමක් වී තිබෙන බැවින් ඒ පිළිබඳව සාකච්ඡා කිරීම කාලීන වශයෙන් වැදගත් වේ.

## ප්‍රතිඵල හා සාකච්ඡා

වර්තමානයේ සමාජ සංස්ථා බිඳ වැටීම උදෙසා යුතුකම් වගකීම් නිසියාකාරයෙන් ඉටු නොකිරීම හා පුද්ගල ජීවිත මුදල මත තීරණය වීම හේතු වී තිබේ. සමාජ සම්බන්ධතාවයක් ගැටුමකින් තොරව පවත්වාගෙන යාම උදෙසා පුද්ගලයාගෙන් පුද්ගලයාට ඉටුවිය යුතු යුතුකම් වගකීම් නිසියාකාරයෙන් ඉටු කිරීම වැදගත් වේ. සිඟාලෝවාද සූත්‍රයෙහි සමාජ සම්බන්ධතාවයන් ගැටුම්වලින් තොරව ධාර්මිකව පවත්වාගෙන යාම උදෙසා අවශ්‍ය උපදේශයන් ගණනාවක් සපයා තිබේ. එය බෞද්ධ අබෞද්ධ දෙපාර්ශයට ම පොදු කාහටත් ප්‍රයෝජනවත් වන ඉගැන්වීමක් ලෙස පෙන්වා දිය හැක. එහි තුදුස්ලාමක ධර්ම යටතේ සතර කර්ම ක්ලේශයන්ගෙන්, සතර අගතියෙන් හා බෝග විනාශ මුඛවලින් වැළකී ක්‍රියා කළ හැකි ආකාරය පෙන්වා දී තිබේ. දස අලාමක ධර්ම යටතේ සතර සංග්‍රහ වස්තුව හා සදිසා සමාජ ක්‍රමය දක්වා ඇත. එහි දෙලොව අභිවෘද්ධිය අපේක්ෂා කරන පුද්ගලයින් එකිනෙකා වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් වගකීම් ඇතුළත්කර තිබේ.

''මාතාපිතා දිසා පුබ්බා - ආචාරියා දක්ඛිණා දිසා
පුත්තදාරා දිසා පච්චා - මිත්තා මත්තාච උත්තරා
දාස කම්මකරා හෙට්ඨා උද්ධං සමණ බ්‍රාහ්මණා''

යනුවෙන් සිඟාලෝවාද සූත්‍රයෙහි සමාජ සංස්ථාවන් වර්ගකර අනතුරුව ඔවුනොවුන් වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් 61ක් විස්තරකර තිබේ. මෙම යුතුකම් වගකීම් නිසියාකාරයෙන් ඉටු නොකරන විට සමාජය තුළ විවිධ ප්‍රශ්න ඇතිවන බව පැහැදිලි කර ඇත. ඒනිසා ධාර්මික සමාජයක් ගොඩනගා ගැනීම අපහසු වේ.

මාපිය දූදරු සම්බන්ධතාව වර්තමාන සමාජ සංස්ථාව තුළ දෙදරා ගිය අවස්ථා සුලභය. එලෙස සිදුවීම උදෙසා එකිනෙකා විසින් ඉටුවිය යුතු යුතුකම් වගකීම් මගහැරී යාම හේතු වී තිබේ. මව්පියන් විසින් තම දූදරුවන් වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් වගකීම් සියල්ල නොපිරිහෙළා ඉටු කරන විට දරුවන් ද තම

දෙමාපියන් වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් වගකීම් සියල්ල නිසියාකාරයෙන් ඉටු කිරීමට බැඳී සිටි. එවිට සියලු දෙනාගේම අයිතීන් හිමි වෙයි. සම්බන්ධතා ශක්තිමත්වන අතර සමාජය යහපත් වේ. ඔවුනොවුන්ගේ යුතුකම් වගකීම් ගිලිහී යාමත් සමග සම්බන්ධතාවය දෙදරා ගොස් සමාජයේ විවිධ ප්‍රශ්න ඇති කරයි.ගැටුම්වලින් තොර යහපත් සමාජයක් බිහිකර ගැනීම උදෙසා එකිනෙකා වෙත පැවරී තිබෙන යුතුකම් වගකීම් නිසියාකාරයෙන් ඉටු කිරීම වැදගත් කරුණකි. දෙමාපියන් තම දරුවන් නොහඳුනන අතර දූ දරුවන් ද තම මව්පියන් නොහඳුනන තත්ත්වයට පත්ව ඇති අවස්ථා ජනමාධ්‍ය තුළින් නිරන්තරයෙන් ම අසන්නට දකින්නට ලැබෙන තොරතුරුවලින් පැහැදිලි වේ. දූ දරුවන් තම දෙමාව්පියන් මහමග, මහළු නිවාසවල දමා යාම හා සත්ත්ව කූඩුවල, කාමරවල සිරගතකර විවිධ වදහිංසා පැමිණවූ අවස්ථා ඒ අතර සුලබ තත්ත්වයකි. මෙම තත්ත්වය දරුවන් උදෙසා ද එලෙසම බලපා තිබේ. මෙවැනි තත්ත්වයක් ඇතිවීම උදෙසා එකිනෙකා වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් මගහැරී යාම හේතු වී තිබේ.

මෙලොව පරලොව දියුණුව අපේක්ෂා කරන්නන් විසින් ඉටුකළ යුතු වැදගත් ම යුතුකම වන්නේ අඹු දරුවන්ට සංග්‍රහ කිරීම යි. මේ කාරණය හරි හැටි ඉටු නොවන්නේ නම් පවුල් සංස්ථාව තුළ විවිධ ගැටුම් ඇති වේ. එනිසා එකිනෙකා විසින් ඉටුකළ යුතු යුතුකම් නොපිරිහෙළා ඉටු කිරීම වැදගත් ය. එවිට පවුල තුළ සමගිය ඇති වේ. සුහදත්වය වර්ධනය වී සමාජ අභිවෘද්ධිය උදාවෙයි. නමුත් වර්තමානයේ මෙම සම්බන්ධතාවය විවිධාකාර හේතු නිසාවෙන් දෙදරා ගොස් තිබෙන බව පැහැදිලි වේ. මේ සඳහා ප්‍රධාන හේතු සාධකයක් වී ඇත්තේ එකිනෙකා වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් වගකීම් ඉටු නොකිරීමයි. අපේක්ෂාකරන ලද සිතැඟියාවන් එකිනෙකා වෙතින් නොලැබී යාමත් සමග ඒ දේ අයහපත් මාර්ගයෙන් හෝ ලබා ගැනීමට උත්සාහ දරයි. එලෙස පුද්ගලයින් උත්සාහ කිරීමත් සමග සමාජ තුළ විවිධ ප්‍රශ්න උද්ගත වේ. ඒ හේතුවෙන් පවුල් සංස්ථාව බිඳ වැටී දරුවන්ගේ සුරක්ෂිතතාව බිඳ වැටෙයි. වර්තමාන සමාජය තුළ දික්කසාය නඩු වැඩි වීම උදෙසා ද මෙම තත්ත්වය බලපා තිබේ. මෙකී තත්ත්වයන් මගහරවා ගැනීම උදෙසා එකිනෙකා විසින් තම යුතුකම් වගකීම් නිසියාකාරයෙන් ඉටු කිරීම වැදගත් වේ.

ගුරු ශිෂ්‍ය යුතුකම් හා වගකීම් නිසියාකාරයෙන් ඉටුකළ විට ගුණ නුවණින් හෙබි ශිෂ්‍ය පරම්පරාවක් නිර්මාණයකර ගැනීමට හැකි වේ. ඒ උදෙසා ගුරු ගෝල සම්බන්ධතාව ශක්තිමත් විය යුතු ය. එවිට සමාජය දියුණු වෙයි. නමුත් වර්තමාන සමාජ පසුබිම තුළ මෙම සම්බන්ධතාව දෙදරා ගිය අවස්ථා පවතී. ගුරුවරුන් විසින් තම ශිෂ්‍යයන්ට වැරදි උපදේශයන් ලබා දීම හා වැරදි ක්‍රියාවන් සඳහා යොමුකර ගැනීමට උත්සාහ දැරූ අවස්ථාවන් පිළිබඳ තොරතුරු සුලභ ය. එසේ ම ශිෂ්‍යයින් ද ශිල්ප ශාස්ත්‍රය ලබා දෙන ගුරුවරුන් නොසළකා හරින තත්ත්වයට පත්ව සිටි.මෙම තත්ත්වය තවදුරටත් සිදු වුවහොත් ගුරු ගෝල සම්බන්ධතාවය බිඳ

වැටී සමාජ සංස්ථාව තුළ මහත් ව්‍යසනයක් ඇති කරලීමට සමත් වෙයි. වර්තමාන සමාජය තුළ හිතමිතුරු සම්බන්ධතාවයතාවය ද බිඳ වැටී පවතී. කල්‍යාණ මිත්‍රයින් සෑම විටම තම මිතුරන්ගේ දියුණුව අපේක්ෂා කරමින් ඔවුන්ව යහපතෙහි පිහිටුවීම උදෙසා කටයුතු කරන නමුත් පාපමිත්‍රයින් තම මිතුරන්ගේදියුණුවට ඊර්ශියා කරමින් ඔවුන්ව අයහපතෙහි යෙදවීමට කටයුතු කරයි. පාපමිත්‍රයින් තම මිතුරන්ගේ ධනය විනාශ කරමින් ඔවුන්ව වැරදි ක්‍රියාවන් සිදු කිරීමට යොමු කළ අවස්ථාවන් නැතුවා නොවෙයි. ඒනිසා අප සෑම විටම කල්‍යාණ මිත්‍ර ඇසුරක් පවත්වා ගැනීම වැදගත් වේ.

වර්තමාන සමාජය තුළ අරගල කිරීම සුලබ තත්ත්වයකි. ආයතන ප්‍රධානීන් තම සේවකයින් උදෙසා ඉටුකළ යුතු යුතුකම් පැහැර හැරීමත් සමග සේවකයින් තම අයිතීන් දිනාගැනීමට අරගල කරයි. ඒ හේතුවෙන් සමාජ සංස්ථාව තුළ විවිධාකාර ප්‍රශ්න නිර්මාණය වී තිබේ. එම ගැටලු විසඳා ගැනීමට නම් සේව්‍ය සේවක යුතුකම් වගකීම් නිසියාකාරයෙන් ඉටු කිරීම වැදගත් වේ. එසේම ගිහි පැවිදි සම්බන්ධතාව ද වර්තමාන සමාජ සංස්ථාව තුළ තරමක් දුරට ඈත් වී තිබේ. වර්තමාන සමාජ පසුබිම තුළ උද්ගත වී තිබෙන සෑම ගැටලුවක් උදෙසා ම එකිනෙකාගෙන් ඉටුවිය යුතු යුතුකම් වගකීම් පැහැර හැරීම හේතු වී තිබෙන බව උපකල්පනය කළ හැකි වේ. එසේ නම් මෙකී තත්ත්වය වළක්වා ගැනීම උදෙසා එකිනෙකා වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් වගකීම් නිසියාකාරයෙන් ඉටු කිරීම වැදගත්වනවා සේම තමන්ට හිමිවිය යුතු අයිතිවාසිකම් ද බුක්ති විඳීමට අවස්ථාව උදාවෙයි වෙයි. එවිට සමාජ සංස්ථාව දියුණු වේ.

ප්‍රමුඛ පද :- යුතුකම් වගකීම්, සමාජ සංස්ථාව, ගැටුම්, අයිතිවාසිකම්, එකිනෙකා

ආශ්‍රිත ග්‍රන්ථ

වීරරත්න, ඩබ්ලිව්. ජී, (1995).*බුද්ධදහම සහ එහි ආගමික පසුබිම*, කොළඹ 12: ප්‍රදීප් ප්‍රකාශකයෝ.

විජේබණ්ඩාර, චන්දිම, මොරටුවගම, එච්. එම්.(1995).*ආදී බෞද්ධ චින්තනය*, මහරගම: තරංජි ප්‍රින්ට්ස්

පඤ්ඤාලෝකහිමි, මීගොඩ.(2000).*බුදු රජාණන් වහන්සේ බෞද්ධ අධ්‍යාපනය සහ බෞද්ධ අර්ථ ක්‍රමය*, කොළඹ 08: සදීපා ප්‍රකාශකයෝ.